දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 15 /2016

මගේ අංක:එස්ඩබ්ඩී/01/2016
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016.03.16 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරි / සහකාර අධිකාරිවරුන් වෙත.

**අභාවප්‍රාප්ත වන නිලධාරීන් හට පාරිතෝෂිකයක් ලබාදීම සම්බන්ධවයි.**

ඉහත කරුණ සම්බන්ධයෙන් මාගේ අංක:45/99 හා 1999.11.10 වන දින දරණ චක්‍රලේඛයට අමතරවයි. 2016.02.27 වන දින පැවැති මාණ්ඩලික නිලධාරීන්ගේ සාකච්ඡාවේදී ගන්නා ලද තීරණයකට අනුව අභාවප්‍රාප්ත වන නිලධාරීන් /නිලධාරිනියන්ගේ යැපෙන්නන් උදෙසා මරණ පාරිතෝෂික වශයෙන් මෙතෙක් ගෙවන ලද රුපියල් 20.00 ක මුදල වෙනුවට රු:50.00 දක්වා වැඩි කර ගෙවීම් කිරිමට තීරණය කර ඇත.

02). ඒ අනුව ඔබ ආයතනයේ සේවයේ යෙදී සිටියදී අභාවප්‍රාප්ත වන නිලධාරීන් /නිලධාරිනියන් පිළිබද විස්තර, සිද්ධිගත දින සිට දින 10 ක් ඉකුත්ව යාමට පෙර,බන්ධනාගාර මූලස්ථාන නිලධාරීන්ගේ සුභ සාධක හා සංවර්ධන අංශය වෙත පහත සදහන් ලිපිලේඛන ඔබගේ නිර්දේශය සහිතව දන්වා එවීමට කටයුතු කරන්න. එම දැනුම් දීමෙන් පසුව , සියළු බන්ධනාගාර ආයතන වලට දන්වා අදාල මුදල් අයකර යැපෙන්නන්ගේ ගිණුමට බැරකිරිමට කටයුතු කර එහි සවිස්තර වාර්තාවක් මාවෙත ලබාදීමට කටයුතු කරන්න.

I. ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරියගේ ඉල්ලීම් ලිපිය.
II. මියගිය බන්ධනාගාර නිලධාරියාගේ /නිලධාරිනියගේ මරණ සහතික පිටපතක්.
III. විවාහක නිලධාරියෙකු/නිලධාරිනියක් නම් විවාහ සහතිකයේ සහතික පිටපතක්, අවිවාහක නිලධාරියෙකු / නිලධාරිනියක් නම් ඔහුගේ හෝ ඇයගේ කිට්ටුම ඥාතිත්වය සනාථ කිරීම සදහා අවශ්‍ය ලිපි ලේඛණ.
IV. යැපෙන්නන් පිළිබද සහතිකයෙහි සහතික කරන ලද පිටපතක්.
V. මරණ පාරිතෝෂික ඉල්ලුම්කරන අයගේ බැංකු ගිණුමෙහි පාස්පොතෙහි සහතික කරන ලද ඡායාපිටපතක්. (නම සහ ගිණුම් අංකය ඇතුලත් පිටුව)

03).මෙම චක්‍රලේඛය 2016.04.01 දින සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**